# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2193/55 - 2020 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්ති යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නාමල් රාජපක්ෂ (පා.ම.),**
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. 2017.02.25 වැනි දින නිකුත් කරන ලද ක්‍රීඩා විධානය මගින් ජාතික ක්‍රීඩා සංගම්වල තේරීම් කමිටු පත්කිරීමේ ක්‍රමවේදය ඉවත් කරමින් සහ 2016.10.27 වැනි දින නිකුත් කරන ලද ගැසට් පත්‍ර අංක 1990/23 දරන රෙගුලාසිවල III කොටස් අංක 7 හා (XIV) අයිතමය ඉවත්කොට සංශෝධනය කරන ලද 2017.02.13 දිනැති අංක 2006/13 *අති විශේෂ ගැසට් නිවේදනයේ* අංක 7(XIV) (අ), (ආ) සහ (ඇ) වගන්ති ඉවත් කර සංශෝධනය කරන ලද අංක 2166/9 හා 2020.03.10 දිනැති නිවේදනයේ 07 (XIV) (ආ) වගන්තිය ඉවත් කර පහත වගන්තිය ආදේශ කරමින්.

(ආ) ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල තේරීම් කමිටුව පත්කිරීම සඳහා අදාළ ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය තම ක්‍රීඩා සංගමයට/සම්මේලනයට අනුබද්ධ සියලුම සාමාජික ආයතන නිසි පරිදි දැනුවත් කොට නාම යෝජනා ලබා ගෙන විධායක කමිටු රැස්වීමක් මගින් වඩා සුදුසු සාමාජිකයන් දසදෙනෙකු (10) තෝරා ගැනීම කළ යුතු අතර තෝරා ගන්නා ලද නාමයෝජනා ලේඛනය සහිත අයදුම්පත්‍ර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාටද පිටපතක් සහිතව ජාතික තේරීම් කමිටුව වෙත යොමුකළ යුතුය. ජාතික තේරීම් කමිටුව විසින් එම නාමයෝජනා පිළිබඳව තම නිර්දේශිත කමිටු නාමලේඛනය ජාතික ක්‍රීඩා සභාව වෙත යොමුකළ යුතුය. ජාතික ක්‍රීඩා සභාව විසින් එම නිර්දේශ තවදුරටත් සළකා බලා එම සභාවේ එකඟත්වය, අනුමැතිය සඳහා විෂයභාර අමාත්‍යවරයා වෙත යොමු කළ යුතුය.

10 - 181

1A - G 032930 — 20 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*